**ලංකා විදුලිබල මණ්ඩලය - 2015**

**------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා විදුලිබල මණ්ඩලයේ (ලංවිම) මූල්‍ය ප්‍රකාශන හා ලංකා විදුලිබල මණ්ඩලයේ හා එහි පරිපාලිත සමාගම්වල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 31 දරන පනතින් සංශෝධිත 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 49(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම හැර අනෙකුත් පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිතයන්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරි සමාගම් විසින් විගණනය කරන ලදි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර/ ශ්‍රීලංමූවාප්‍ර) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

---

## 2.1 මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ලංකා විදුලිබල මණ්ඩලයේ (ලං වි ම) මූල්‍ය ප්‍රකාශනවලින් හා ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිතයන්හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට එහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---

### 2.2.1 සමූහයේ මූල්‍ය ප්‍රකාශන

---

සීමාසහිත ලංකා කෝල් පුද්ගලික සමාගමේ (LCC) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනය විගණකාධිපති විසින් සෘජු විගණනයට භාජනය කරන ලද අතර පහත සඳහන් කරුණු පදනම් කරගෙන තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කරන ලදී.

i අනාගත වගකීම් ඉටුකර ගැනීම සඳහා සමාගම විසින් එහි විශ්‍රාම ප්‍රතිලාභ වෙනුවෙන් ආයෝජනය කර නොතිබුණු අතර විධිමත් ආකාරයෙන් නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම ගිණුම්කරණය සඳහා අනුගමනය කළ යුතු පියවරයන් සමාගම විසින් ශ්‍රී ලං ගි ප්‍ර 19 - සේවක ප්‍රතිලාභ හි විධිවිධාන ප්‍රකාරව, ක්‍රියාත්මක කර නොතිබුණි.

ii අස්ථිත්වයක් විසින් "මූල්‍ය වත්කම්" යටතේ "එහි ණය හා ලැබිය යුතු මුදල්" හඳුනාගත යුතු අතර සඵල පොලී අනුපාත ක්‍රමය යොදාගනිමින් පසුව ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය කළ යුතුය. කෙසේ වුවද රු.336,683,193 ක් වූ තාප ගල් අඟුරු නැව්ගත තොගය සඳහා වෙළඳ ණයගැති අත්තිකාරම් හා රු.47,624,500 ක් වූ වාෂ්ප ගල් අඟුරු වෙළඳ ණයගැතියන් (ලංවිම) ආදී මූල්‍ය වත්කම් ශ්‍රී ලං ගි ප්‍ර 39 - මූල්‍ය උපකරණ : හඳුනාගැනීම හා මිනුම්කරණය හි විධිවිධාන ප්‍රකාරව ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය කර නොතිබුණි.
තවද වෙළඳපොළ පොලී අනුපාතයට වඩා අඩු පොලී අනුපාතයකට ලබාදෙන ලද සේවක ණය, සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගත යුතු අතර, වෙළඳපොළ පොලී අනුපාතය හා ණය වලින් ලැබෙන පොලී අනුපාතය අතර වෙනස සේවක පිරිවැය ලෙස හඳුනාගත යුතුය. කෙසේ වුවද, සමාගම ප්‍රමිතියේ නියමය පරිදි ණය මත, සේවක පිරිවැය හඳුනාගෙන නොතිබුණි.

iii සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල රු.380,343,765 ක් විය. කෙසේ වුවද, ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූපී මුදල රු.734,086,996 ක් විය. එබැවින්, එම මූල්‍ය ප්‍රකාශන ද්විත්වයෙහි රු.353,743,231 ක නොසැසඳු වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.2 ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන**

**-------------------------------------------------**

**2.2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලං ගි ප්‍ර/ ශ්‍රී ලං මූ වා ප්‍ර) හා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල වීම**

**-----------------------------------------------------------------------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකා විදුලිබල මණ්ඩලය එහි ප්‍රාග්ධනය හා නඩත්තු කාර්යයන් සඳහා දරන ලද ශ්‍රමය, ද්‍රව්‍ය හා පොදුකාර්ය පිරිවැය අගය කිරීම සඳහා තථ්‍ය පිරිවැය වෙනුවට ප්‍රමිත පිරිවැය යොදාගනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, එකතුව රු.5,532,803,700 ක් වූ ශුද්ධ ද්‍රව්‍ය මිල විචලනය හා ශ්‍රමය සහ පොදුකාර්ය අනුපාත විචලනයන් පහත සඳහන් අඩුපාඩුකම් සහිතව ගිණුම්ගත කර තිබුණි.

i තොග හා කෙරීගෙන යන වැඩ (WIP) සහ දේපල, පිරියත හා උපකරණ (PPE) අගය කිරීම සඳහා ප්‍රමිත මිල යොදාගැනීම පිළිවෙලින් ශ්‍රී ලං ගි ප්‍ර 2- තොග හා ශ්‍රී ලං ගි ප්‍ර 16 - දේපල, පිරියත හා උපකරණ යන ප්‍රමිත සමඟ අනුකූල වී නොතිබුණි.

ii ප්‍රාග්ධන කාර්යයන්වලට අදාළව ඉතා ඉහළ මූල්‍ය සම්බන්ධය හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම් හා වගකීම් හා ස්කන්ධය කෙරෙහි එයින් සැලකිය යුතු බලපෑමක් ඇති වී තිබුණි. කෙසේ වුවද, අවශ්‍ය තොරතුරු නොමැති වීම හේතුවෙන් එයින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම විගණනයේදී නිශ්චය කළ නොහැකි විය.

iii ශ්‍රී ලං ගි ප්‍ර 39 - මූල්‍ය උපකරණ, හඳුනාගැනීම හා මිනුම්කරණය : වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයට අස්ථිත්වය හෙළිදරව් කරන මූල්‍ය උපකරණවලින් පැන නඟින අවදානම පිළිබඳ ස්වභාවය හා ප්‍රමාණය ඇගයීම් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ප්‍රමිතියේ අවශ්‍යතාවය පරිදි හෙළිදරව් කර නොතිබුණි.

තවද, මෙම ප්‍රමිතියේ අවශ්‍යතාවය පරිදි පහත දැක්වෙන විෂයයන් ඒවායේ සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

* සේවක ණයගැතියන්

* බද්ධ ව්‍යාපාරවල ආයෝජනය කිරීම

**2.2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**---------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2013/2014 තක්සේරු වර්ෂය සඳහා රු.3,939,497,475 ක්වූ ආදායම් බදු සඳහා ගිණුම්වල ප්‍රතිපාදනයක් කර නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන බදු බැරකම සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) එවකට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය නමින් 2009 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද රු.46,884,422 ක් වටිනා වාහන 6 ක් ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව දක්වා තිබූ අතර ඒ අනුව ක්ෂයවීම් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන දේපල, පිරියත හා උපකරණ සහ සමුච්චිත ක්ෂය පිළිවෙලින් රු.46,884,422 කින් හා රු.31,631,338 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා ලාභය හා 2015 දෙසැම්බර් 31 දිනට රඳවාගත් ලාභය පිළිවෙලින් රු.6,697,772 කින් හා රු.31,631,338 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) රේඛීය අමාත්‍යාංශයට මුදා හරින ලද රු.7,267,690 ක් පිරිවැය වූ වාහන 11 ක් වර්ෂ කිහිපයකට පෙර සිට අස්ථානගත වී තිබුණි. එසේ වුවද, කිසිදු ගැලපීමක් කිරීමෙන් තොරව ලංකා විදුලිබල මණ්ඩලයේ ගිණුම් පොත්වල එම වත්කම් ඇතුළත්ව තිබුණි. මේ සම්බන්ධයෙන් කිසිදු විමර්ශනයක් මේ දක්වා සිදුකර නොමැති බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ සිදුකරන ලද භෞතික සත්‍යාපනයේදී හඳුනාගන්නා ලද රු.33,526,482 ක් වටිනා ඉන්ධන තොග ඌනතාවය ගිණුම්වල ගලපා නොතිබුණි. තවද, මේ සම්බන්ධයෙන් විමර්ශනයන් 2017 අප්‍රේල් අවසානය වන විටත් සිදුකර නොතිබුණි.

### 2.2.2.3 නොසැසඳූ වෙනස්කම්

බිල්පත් පද්ධතියේ 2015 දෙසැම්බර් 31 දිනට දැක්වෙන තොග හා සාමාන්‍ය ණයගැතියන් සහ සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු.911,254,975 ක් වූ නොසැසඳූ වෙනස්කම් නිරීක්ෂණය විය.

### 2.2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට රු.14,069,944,922 ක වෙළඳ ණයගැතියන් අතුරින්, සාමාන්‍ය හා තොග සැපයුම් වලට අදාළව එකතුව රු.3,065,299,421 ක්වූ ණයගැතියන් වර්ෂයකට වැඩිකාලයක් හිඟ හිට පැවති අතර, ඉන් රු.1,233,096,468 ක් අයකර ගැනීමෙන් තොරව වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ආ) කිසිදු අයකර ගැනීම් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව, 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවති වෙනත් ලැබිය යුතු ශේෂ රු.2,294,287,211 ක් විය. විස්තර පහත දැක්වේ.

| ණයගැතියාගේ නම | මුදල | ගනුදෙනුවේ ස්වභාවය |
|---|---|---|
| | රු. | |
| සීමාසහිත වුඩ් ගෲප් ගෑස් ටර්බයින් | 8,264,352 | වෙස්ට් කෝස්ට් විදුලිබල පිරියත සඳහා ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම සඳහා ගෙවීම. |
| විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 6,142,276 | වෙස්ට් කෝස්ට් විදුලිබල පිරියත විවෘත කිරීමේ උත්සවය සඳහා ගෙවීම. |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | 897,025,999 | කුඩා විදුලිබල සංවර්ධකයින්ට ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගාස්තු ගැලපීම, ගෙවීම. |

| | | |
|---|---|---|
| සීමාසහිත ලින්ඩෙල් (පුද්ගලික) සමාගම | 5,137,329 | සීමාසහිත ඒෂියා පවර් (පුද්ගලික) සමාගමට ලබා ගන්නා ලද ඉඩම සඳහා 1997 වර්ෂයේ සිට ගෙවන ලද බදු කුලිය. |
| සීමාසහිත ඒෂියා පවර් (පුද්ගලික) සමාගම | 1,000,000 | බදු දී තිබෙන ඉඩම සඳහා කරන ලද තැන්පතු |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLRDC) | 7,755,810 | බදු දී තිබෙන ඉඩම වෙනුවෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට ගෙවන ලද රු.10,631,560 ක මුළු බදු මුදලින් ක්‍රමක්ෂය කිරීම සඳහා පැවති ශේෂය. |
| සීමාසහිත ඒඊඑස් කැළණිතිස්ස (පුද්ගලික) සමාගම | 1,368,961,445 | මිල වෙනස්කම් පිළිබඳ ගෙවීම් මත අයකරගත යුතු මුදල |
| | ------------------ | |
| එකතුව | 2,294,287,211 | |
| | =========== | |

(ඇ) වර්ෂ 5 කට වැඩි කාලයක් සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමෙන් (LECO) ලැබිය යුතු රු.46,548,248 ක මුදලක් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

විගණනයේදී පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

### (අ) 1969 අංක 17 දරන ලංකා විදුලි බල මණ්ඩල පනත

(i) 47(1)(ආ) වගන්තිය - ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලබාගන්නා ලද ණය ආපසු ගෙවීමට අදාළව ලංකා විදුලිබල මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය සමඟ නිදන් අරමුදලක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. මූල්‍ය ප්‍රකාශනවල සංචිතය දක්වා තිබුණද, එය 2000 වර්ෂයේ සිට යාවත්කාලීන කර නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට එම සංචිත ගිණුමේ ශේෂය රු.මිලියන 17,708 ක් විය.

(ii) 47(2)(අ) වගන්තිය - ලංකා විදුලිබල මණ්ඩලයේ චංචල හා නිශ්චල දේපලවල ක්ෂය ආවරණය කර ගැනීම සඳහා මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය සමඟ ක්ෂය සංචිතයක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. කෙසේ වුවද එම අවශ්‍යතාවයට පටහැනිව, 2000 දෙසැම්බර් 31 දක්වා වාර්ෂිකව රු.මිලියන 1 ක් මාරු කිරීම මඟින් මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය සංචිතයක් ඇති කර තිබූ අතර, ඉන්පසු කිසිදු ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි. එදිනට සමුච්චිත ශේෂයක්ව පැවති රු.මිලියන 23 ක මුදල කිසිදු සමාලෝචනයකින් තොරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(iii) 47 2 (ආ) වගන්තිය - ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කර ගැනීම සඳහා හා මණ්ඩලය විසින් වරින්වර තීරණය කරනු ලබන වෙනත් එවැනි අරමුණු සඳහා මණ්ඩලයේ ආදායම් මුදල්වලින් ප්‍රාග්ධන වැඩ සඳහා මූල්‍යායනය කිරීමේ අරමුණින් මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය සමඟ එක්ව පොදු සංචිතයක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. කෙසේ වුවද එම අවශ්‍යතාවයට පටහැනිව මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ප්‍රාග්ධන සංචිතයක් ස්ථාපිත කර තිබූ නමුත් 2000 වර්ෂයේ සිට එය යාවත්කාලීන කර නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට එම සංචිත ගිණුමේ ශේෂය රු.මිලියන 165.446 ක් විය.

මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ සභාපතිවරයා විසින් පහත පරිදි දක්වා තිබුණි.
"ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් ඇති අවස්ථාවලදී, අරමුදල් මාරුකිරීම මඟින් මෙම සංචිත පවත්වා ගැනීමට 2014 දෙසැම්බර් 15 දින පවත්වන ලද රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබුණි"

(ආ) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 46 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 11 කොටසේ II (අ) සහ (ආ) වගන්තිවල විධිවිධානවලට පටහැනිව මණ්ඩලය විසින් 1989 වර්ෂයේ සිට එක් එක් වර්ෂය අවසානයේදී දළ ස්ථාවර වත්කම් මුළු වටිනාකමින් සියයට 0.1 ක දායකයක් පදනම් කරගෙන 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 6,037 ක් වූ එහි අරමුදල් ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදලේ ආයෝජනය කර තිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.2 ඡේදය අනුව, සියලු ප්‍රධාන මෙහෙයුම්, ආවරණය වන පරිදි සියලු රාජ්‍ය ව්‍යාපාරයන් විසින් ස්වකීය පද්ධති/ අත්පොත් ක්‍රමවත්ව සංශෝධනය කර හා යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. කෙසේ වුවද, ලංකා විදුලිබල මණ්ඩලය විසින් 1987 වර්ෂයේදී පමණ පිළියෙල කරන ලද එහි පරිපාටි සංග්‍රහයන් සංශෝධනය කර යාවත්කාලීන කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය
---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ලංකා විදුලිබල මණ්ඩලයේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ලංකා විදුලිබල මණ්ඩලයේ හා සමූහයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය පිළිවෙලින් රු.මිලියන 19,876 ක හා රු.මිලියන 24,411 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ පාඩුව පිළිවෙලින් රු.මිලියන 15,003 ක් හා රු.මිලියන 8,779 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ පිළිවෙලින් රු.මිලියන 34,879 ක හා රු.මිලියන 33,190 ක වර්ධනයක් දැක්වුණි.

සමාලෝචිත වර්ෂය තුළ සියයට 35 කින් ශුද්ධ ජල විදුලි හා ගල් අඟුරු විදුලිබල උත්පාදනය වැඩිවීම හේතුවෙන් සියයට 47 කින් තාප විදුලිබල උත්පාදනය අඩුවීම මූල්‍ය ප්‍රතිඵලවල මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

කෙසේ වුවද, 2014 වර්ෂයේ සමස්ත ලාභයට වූ ධනාත්මක දායකයට එරෙහිව 2015 වර්ෂයේදී ඍණාත්මක දායකයක් 2,3 හා 4 යන බෙදාහැරීම් අංශ මඟින් සිදු කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| අංශය | 2015 ලාභය/ (පාඩුව) | 2014 ලාභය |
|---|---|---|
| | රු. | රු. |
| ඩී - 1 | 2,115,611,753 | 2,476,141,130 |
| ඩී - 2 | (662,110,806) | 1,544,956,634 |
| ඩී - 3 | (1,615,856,125) | 1,273,031,982 |
| ඩී - 4 | (1,374,124,575) | 514,742,105 |
| එකතුව | (1,536,479,753) | 5,808,871,851 |

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.2.1 මූල්‍ය තත්ත්වය

ලබාගත හැකි වූ තොරතුරු අනුව, පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුළු වත්කම් සියයට 2 කින් සුළු වශයෙන් වැඩි වී තිබුණි. පෙර වර්ෂයේදී ඍණාත්මක සංඛ්‍යාවක් වූ රු.මිලියන 6,990 ක ශුද්ධ ජංගම වත්කම් 2015 වර්ෂයේදී රු.මිලියන 12,861 ක ධනාත්මක සංඛ්‍යාවක් වී තිබුණු අතර එයින් සියයට 284 ක වැඩිවීමක් නියෝජනය විය. ජංගම වත්කම් අඩුවීම කෙරෙහි ප්‍රධාන හේතුව වූයේ ණය අයකර ගැනීම් ක්‍රියාවලියේ වර්ධනය නොව වැඩපූර්ව අත්තිකාරම් අයකර ගැනීම වැඩිවීමයි.
2015 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් යොදවා තිබූ මුළු ප්‍රාග්ධනයෙන් සියයට 34 ක් හෙවත් රු.බිලියන 214 ක් ණය ගැනීම් මඟින් මූල්‍යයනය කර තිබූ අතර එය පෙර වර්ෂයේ සියයට 37 කින් නියෝජනය විය.

### 3.2.2 ලාභදායීත්වය

ප්‍රමාණවත් ජල විදුලිබල උත්පාදනයක් තිබෙන අවස්ථාවකදී වුවද, විදුලිබල මිලදී ගැනුම් ගිවිසුම්වල කොන්දේසි ප්‍රකාරව ස්ථාවර පිරිවැය දැරීම වැළැක්විය නොහැක. එහි ප්‍රතිඵලයක් ලෙස ලංකා විදුලිබල මණ්ඩලයට එහි බොහෝ වැදගත් අරමුණු වලින් එකක් වන සාමාන්‍ය මහජනතාව සඳහා අඩු පිරිවැයකට විදුලි බල ඒකකයක් සැපයීම සඳහා වූ අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා හැකියාවක් නොමැත.

2004 වර්ෂයේ සාමාන්‍ය ඒකක පිරිවැය වූ රු.19.31 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය ඒකක පිරිවැය රු.14.28 ක් වූ අතර එක් ඒකකයක් රු.16.01 ක සාමාන්‍ය පිරිවැයකට විකුණා තිබුණි. (පෙර වර්ෂයේ සාමාන්‍ය විකුණුම් මිල රු.18.31 ක් විය.) ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ලංකා විදුලිබල මණ්ඩලයට එහි බොහෝ වැදගත් අරමුණු වලින් එකක් වන එක් ඒකකයකින් දළ ලාභය රු. 1.73 ක් වූ අතර පෙර වර්ෂයේ එක් ඒකකයකට රු. 1.00 ක සාමාන්‍ය දළ පාඩුවට සාපේක්ෂව එය එක් ඒකකයකට සියයට 273 ක වැඩිවීමක් විය. ගාස්තු වර්ගය හා පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විකුණුණු විදුලිබල එක් ඒකකයකට දායකය (Kwh) පහත වගුවෙන් දැක්වේ.

| වර්ගය | එක් ඒකකයකට දායකය (Kwh) | |
|---|---|---|
| | **2015** | **2014** |
| | රු. | රු. |
| ගෘහස්ථ | (1.40) | (4.07) |
| ආගමික ස්ථාන | (7.15) | (12.33) |
| සාමාන්‍ය කාර්යය | 9.65 | 8.58 |
| කර්මාන්ත | 0.49 | (2.73) |
| රජය | 4.04 | (0.57) |
| හෝටල් | 3.46 | 0.83 |
| වීථි ආලෝකකරණය | (14.28) | (19.31) |
| ලංකා විදුලි (පුද්ගලික) සමාගමට විකුණුම් | 1.14 | (0.84) |
| එක් ඒකකයකට සාමාන්‍ය දායකය | 1.73 | (1.00) |

ඒ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මුළු දායකයට වැඩිම ධනාත්මක දායකය සපයා තිබුණේ සාමාන්‍ය කාර්යය ගාස්තු වර්ගයෙනි. එසේම කර්මාන්ත, රජය, හෝටල් සහ ලංකා විදුලිබල සමාගමේ වර්ගයන්ද ඒ සඳහා ධනාත්මක දායකයන් විය. සමාලෝචිත වර්ෂයේ මුළු දායකයට වැඩිම සෘණාත්මක දායකය වූයේ ගෘහස්ථ වර්ගය මත ගාස්තු ක්‍රමයයි. එසේම ආගමික හා වීථි ආලෝකකරණ ගාස්තු වර්ගයද ඒ සඳහා අහිතකර දායකයන් දක්වා තිබුණි.

## 3.3 මෙහෙයුම් සමාලෝචනය

### 3.3.1 විදුලිබල උත්පාදනය හා සෘජු පිරිවැය

සමාලෝචිත වර්ෂය තුළ විදුලිබල උත්පාදනය සහ විදුලිබල මිලදී ගැනුම් සඳහා දරන ලද සෘජු පිරිවැය පිළිබඳ සාරාංශයක් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත වගුවලින් දැක්වේ.

**(i)** **විදුලිබල උත්පාදනය**

| ප්‍රභවය | වර්ෂය තුළ විදුලිබල උත්පාදනය | | වැඩිවීම/ (අඩුවීම) | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | **2015** | **2014** | | |
| | ගිවොපැ | ගිවොපැ | ගිවොපැ | |
| ජලවිදුලි | 5,970 | 4,534 | 1,436 | 32 |
| තාප | 2,275 | 4,306 | (2,031) | (47) |
| ගල් අඟුරු | 4,443 | 3,202 | 1,241 | 39 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති | 402 | 315 | 87 | 28 |
| එකතුව | 13,090 | 12,357 | 733 | 6 |

ඉහත විශ්ලේෂණයට අනුව, ගිවොපැ 733 ක වැඩි වූ ඉල්ලුම, තාප නොවන ප්‍රභවයන් මාර්ගයෙන් හා 2015 වර්ෂයේ වූ හිතකර වැසි තත්ත්වයන් හේතුවෙන් සපුරා ගෙන තිබූ බව

අනාවරණය විය. තාප විදුලිබල උත්පාදනය ගිවොපැ 2,031 කින් අඩු කිරීමට හැකි වී තිබූ අතර එහි ප්‍රතිඵලය වූයේ රු. මිලියන 37,418 කින් විකුණුම් පිරිවැය අඩු කිරීමට හැකි වීමයි.

**(ii) විදුලිබල උත්පාදනය හා විදුලිබලය මිලදී ගැනීම සඳහා දරන ලද සෘජු පිරිවැය**

| පිරිවැය විෂයය | දරන ලද සෘජු පිරිවැය | | | |
|---|---|---|---|---|
| | 2015 | | 2014 | |
| | **රු. මිලියන** | **ප්‍රතිශතය** | **රු.මිලියන** | **ප්‍රතිශතය** |
| විදුලිබලය මිලදී ගැනුම් | 63,732 | 48 | 101,149 | 56 |
| **විදුලිබල උත්පාදනය** | | | | |
| - ගල් අඟුරු | 20,991 | 16 | 17,031 | 9 |
| - ඉන්ධන | 23,114 | 18 | 46,582 | 26 |
| | 107,837 | 82 | 164,762 | 91 |
| **වෙනත් මෙහෙයුම් පිරිවැය** | | | | |
| - මෙහෙයුම් හා නඩත්තුව | 10,771 | 8 | 5,984 | 3 |
| - ක්ෂය | 13,459 | 10 | 11,513 | 6 |
| සෘජු පිරිවැය | 132,067 | 100 | 182,259 | 100 |

ඒ අනුව 2015 හා 2014 වර්ෂයේ මුළු මෙහෙයුම් පිරිවැයෙන් පිළිවෙලින් සියයට 82 ක් හා සියයට 91 ක් විදුලිබල මිලදී ගැනුම් හා විදුලිබල උත්පාදනය සඳහා සෘජුවම අදාළ වන බව අනාවරණය විය.

### 3.3.2 ලක් විජය විදුලි බලාගාරයේ (LVPS) මෙහෙයුම්

2015 දෙසැම්බර් 31 දිනට ගල් අඟුරු තොගය ස්වාධීන මැනුම්කරු සමාගමක් විසින් භෞතිකව සත්‍යාපනය කර තිබුණු අතර එම සමාගම විසින් නිකුත් කරන ලද වාර්තාව පදනම් කරගෙන සත්‍යාපන කණ්ඩායම විසින් රු. 760,280,883 ක් වටිනා මෙට්‍රික් ටොන් 65,148 ක ගල් අඟුරු ඌනතාවයක් හඳුනා ගෙන තිබුණි. ප්‍රධාන වශයෙන් ගල් අඟුරු මෙහෙයවීමේදී පවතින පහත සඳහන් අඩුපාඩු හේතුවෙන් නිරවද්‍යතාවය පිළිබඳ අනුමානය හේතු කොටගෙන මෙම ඌනතාවය ගිණුම් පොත් වලට ගෙන නොතිබුණි.

* අංගණයට ගල් අඟුරු ලැබීම හා නිකුත් කිරීම මැනීම සඳහා ක්‍රමයක් නොවීම.

* පිරියතට ගල් අඟුරු යෙදවීම මැනීම සඳහා විශ්වාසදායී ක්‍රමයක් නොවීම.

* ලංකා කෝල් සමාගම හෝ ලංකා විදුලිබල මණ්ඩලය විසින් නැවෙන් බෑම පිළිබඳ නියාමනයක් සිදු නොකිරීම.

* ඉංජිනේරුවන් විසින් පාලනය කරන බැවින්, ගබඩා භාරකරු තොග පාලනයක් සිදු කිරීම වෙනුවට සටහන් කිරීමේ කාර්යයක් පමණක් සිදු කිරීම.

ඒ අනුව ගල් අඟුරු මෙහෙයුම් පිළිබඳ අදාළ පාලන ක්‍රම ස්ථාපිත කර පවත්වා ගැනීම සඳහා ලක් විජය විදුලි බලාගාරය වගකිව යුතු බව නිරීක්ෂණය විය.

## 3.4 අවිධිමත් ගෙවීම්/ආර්ථික නොවූ ගනුදෙනු

-----------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේ සිට බලපැවැත්වීම සඳහා සැලසුම් කරන ලද පරිදි ඊළඟ වැටුප් සංශෝධනයේ සිට උපයන විට ගෙවීම් බදු බැරකම සේවකයින්ට අදාළ කිරීම සඳහා 2007 දෙසැම්බර් 13 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයට පටහැනිව මණ්ඩලය විසින් එහි සේවකයින් වෙනුවෙන් සේවකයන් විසින් දැරිය යුතු උපයන විට ගෙවීම් බදු ගෙවා තිබුණි. තවද ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්ගේ පාරිශ්‍රමික සඳහා සාමුහික ගිවිසුම සැලකිල්ලට ගන්නා ලද අවස්ථාවේදී, 2015 මැයි 20 දින අමාත්‍ය මණ්ඩලය විසින් සමාන තීරණයක් ගන්නා ලදී.

අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද ඉහත තීරණයන් අභිබවා 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ලංකා විදුලිබල මණ්ඩලය විසින් එසේ ගෙවන ලද උපයන විට ගෙවීම් බදු ප්‍රමාණය රු. 2,006,685,521 ක් විය.

2001 මැයි 20 දිනැති අංක 1706/18 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් දක්වා ඇති මුදල් නොවන ප්‍රතිලාභ වටිනාකම එක් එක් සේවකයාගේ උපයන විට ගෙවීම් බදු ගණනය කිරීමේ දී සැලකිල්ලට ගත යුතුය. කෙසේ වුවද නිල නිවාස, වෙන්කළ නිවාස සහ පුද්ගලික භාවිතය සඳහා මෝටර් වාහන සැපයීම ආදි මුදල් නොවන ප්‍රතිලාභ ලංකා විදුලිබල මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ආ) 2007 නොවැම්බර් 14 දිනැති අංක. 07/1955/332/045 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් සඳහා වරින්වර විවිධ සේවක දීමනා ගෙවා තිබුණි. 2014 වර්ෂයේදී එසේ ගෙවන ලද රු.මිලියන 849 ක එවැනි දීමනාවලට සාපේක්ෂව 2015 වර්ෂයේදී රු. මිලියන 1,144 ක්වූ එවැනි දීමනා ගෙවා තිබූ බව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

(ඇ) ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය සඳහා "විදුලක්පාය" නමැති යෝජිත ගොඩනැගිල්ලේ පයිලින් සහ උපදේශක සේවා සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2014 වර්ෂය අවසානයට දරන ලද මුළු වියදම රු. මිලියන 401 ක් විය. කෙසේවුවද 2015 වර්ෂය අවසාන වන විටත් ඉදිකිරීම් වැඩ ආරම්භ කර නොතිබුණි. කෙසේවුවද "විදුලක්පාය" ව්‍යාපෘතිය අත්හැර දමමින් ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල කොළඹ 02, චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත හි ඉදිකිරීම සඳහා 2014 ජූලි 09 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණයක් ගෙන තිබුණි. තවද විකල්ප කාර්යයක් සඳහා මෙම පරිශ්‍රය උපයෝජනය කිරිමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම රැස්වීමේදීම තීරණය කර තිබූ අතර එම කාර්යය මේ දක්වා අවසන් කර නොතිබුණි.

(ඈ) ලංකා විදුලිබල මණ්ඩලය විසින් කාලීන ආකාරයෙන් අරමුදල් භාවිතා නොකිරීම හේතුවෙන් විදේශ මුලායතන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදෙන ලද ණය මුදල්වලින් ණය නියෝජිතායතනය විසින් රු. 77,306,029 ක මුදලක් බැඳීම් ගාස්තු ලෙස අය කර ගෙන තිබුණි.

(ඉ) ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා කෝල් (පුද්ගලික) සමාගම අතර එළඹී ගිවිසුම ප්‍රකාරව, වාර්ෂික චාරිකාවේ පිරිවැය ගල් අඟුරු සැපයීම් ව්‍යාපාරයට අදාළ වූ කොටසක් හෝ පාර්ශවීයක් නොවන නමුත්, එම කාර්යය සඳහා මෙම සමාගම විසින් රු. 1,047,220 ක මුදලක් වැය කර තිබූ අතර ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි.

**3.5 මතභේදයට තුඩුදෙන කරුණු**

--------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකා විදුලිබල මණ්ඩලයේ හා ලංකා ඛනිජතෙල් සංස්ථාවේ (CPC) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 1,963,273,434 ක් හා රු. 2,720,033,516 ක් වූ පිළිවෙලින් ගෙවිය යුතු හා ලැබිය යුතු ශේෂ අතර රු. 756,760,082 ක වෙනසක් නිරීක්ෂණය විය.

ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති විසින් මේ සම්බන්ධයෙන් පහත පරිදි වාර්තා කර තිබුණි.

"2013 සැප්තැම්බර් 30 දින භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් සභාපතිත්වය දරන ලද රැස්වීමේදී ගන්නා ලද තීරණය ප්‍රකාරව, කාලය ඉක්ම වූ ඉන්වොයිස් වටිනාකම මත පොලිය (ණය කාල පරිච්ඡේදයෙන් බැහැරව) 2013 අප්‍රේල් 20 සිට බලපැවැත්වෙන පරිදි ගෙවීමට තීරණය කර තිබුණි. කෙසේවුවද රු. 753,610,829 ක ප්‍රමාද පොලී ගෙවීම ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2013 අප්‍රේල් 20 ට පෙර කරන ලද ඉන්ධන මිලදී ගැනීම් සඳහා අදාළ වේ. එබැවින්, ලංකා විදුලිබල මණ්ඩලය වගකිව යුතු නොවන බැවින් මෙම වෙනස සඳහා සැසඳීමක් සිදු කිරීම අවශ්‍ය නොවේ."

(ආ) ග්‍රාමීය විදුලිබලය ලබාදීමේ වැඩ සටහන් ඇතුළත් උත්පාදනය, සම්ප්‍රේෂණය හා බෙදාහැරීම් වැඩසටහන් සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට ලැබුණු විදේශාධාර හා ප්‍රාග්ධන ප්‍රදාන දීර්ඝ කාලයක් ප්‍රාග්ධන දායකත්වය ලෙස සලකා තිබුණද, එම සමහර ප්‍රදාන මහා භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධන දායකය ලෙස සලකා නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව, ලංකා විදුලිබල මණ්ඩලයට මුළු ප්‍රාග්ධන දායකත්වය රු.බිලියන 269 ක් විය. කෙසේවුවද ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.බිලියන 302 ක් විය. ඒ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශන දෙක අතර රු. බිලියන 33ක නොසැසඳු ශේෂයක් නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා විසින් පහත පරිදි දක්වා තිබුණි.

"මහා භාණ්ඩාගාරය විසින් එහි වාර්තා හා ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්තා අතර රු. බිලියන 33 ක වෙනස ප්‍රාග්ධන දායකත්වය ලෙස ඉදිරියට ගෙන යාමටත් මෙම වෙනස සම්බන්ධයෙන් හෙළි දරව් කිරීම් භාණ්ඩාගාර පොත්වල සිදු කරනු ලබන බවටත් 2015 පෙබරවාරි 13 පැවති රැස්වීමේදී තීරණය කරන ලදී."

(ඇ) රාජ්‍ය සංස්ථා හා මණ්ඩල ඇතුළත් සියලුම රාජ්‍ය අංශයේ සංවිධානවල මූල්‍ය හා පරිපාලනය සම්බන්ධයෙන් සංගත පරිපාටි හා පරිචයන් පවත්වා ගැනීමට වරින්වර රජය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර චක්‍රලේඛ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ රීති වශයෙන් අනුගමනය කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත නොකරන්නේ නම්, ඔවුන්ට ඒවා අදාළ නොවන බවත් 1969 අංක 31 දරන පනතින් සංශෝධිත 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතට අනුකූලව ලංකා විදුලිබල මණ්ඩලය විසින් එම තත්ත්වය පවත්වා ගෙන තිබුණු බවත් විගණනයේදී නිරීක්ෂණය විය. පහත සඳහන් අවස්ථා උදාහරණ ලෙස දැක්විය හැක.

i 1998 මාර්තු 08 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, සියයට 10 සිට සියයට 14 දක්වා පොලි අනුපාතයකට කාර්ය මණ්ඩලයට වාහන ණය ලබා දීම වෙනුවට මණ්ඩලය විසින් සියයට 4.2 ක පොලී අනුපාතයට වාහන ණය ලබා දී තිබුණි. තවද ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රබල ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දී ඇති නමුත් කිසිදු පාලනයකින් තොරව සේවක ණය ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

ii කරුණාකර මෙම වාර්තාවේ 3.4 (අ) හා 3.4 (ආ) ඡේදවල නිරීක්ෂණවලට ද අවධානය යොමු කළ යුතු වේ.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට රක්ෂණ සංචිත අරමුදලේ ශේෂය හා රක්ෂණ සංචිත ආයෝජන අරමුදලේ ශේෂය අතර වූ රු. මිලියන 4,307 ක ඌනතාවය ලංකා විදුලිබල මණ්ඩලයේ ස්වයං රක්ෂණ ප්‍රතිපත්තිය ප්‍රකාරව ආයෝජනය කර නොතිබුණි. එවැනි ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයේ විධිමත් මූල්‍ය කළමනාකරණ ක්‍රමයක් ක්‍රියාත්මක නොවීය.

(ඉ) ලංකා විදුලිබල මණ්ඩලය විසින් වර්ෂ ගණනාවක් ලංකා විදුලි (පුද්ගලික) සමාගමට විදුලිබලය විකුණා තිබූ අතර ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගෙන තිබුණි. එක් එක් ආයතන සමඟ සරලව මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගැනීම සඳහා එම පාර්ශවයන් සමඟ විකුණුම් හා මිලදී ගැනුම් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ඊ) ලක්විජය විදුලිබල පිරියත සඳහා ලංකා කෝල් සමාගම විසින් ගල් අඟුරු ප්‍රසම්පාදනය කිරීම පිළිබඳව 2016 දෙසැම්බර් 30 දින බලශක්ති පිළිබඳ ආංශික පාලන පාර්ලිමේන්තු කමිටුවට ඉදිරිපත් කරන ලද මාගේ විශේෂ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද ප්‍රධාන කරුණු වලින් ලංකා විදුලිබල මණ්ඩලයට වන බලපෑම සාරාංශ කර පහත දැක්වේ.

(i) ගල් අඟුරු ප්‍රසම්පාදනය පිළිබඳ මුල් ලංසු ලියකියවිලිවල සමහර නිර්නායකයන් ඇතුළත් කිරීම සඳහා සියලු පාර්ශවයන්ගේ එකඟතාවය පදනම් කරගෙන පිළියෙල කරන ලද කෙටුම්පත් ගිවිසුම ලංකා කෝල් සමාගම සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්වලට එළඹීමේදී, සංශෝධනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, රු.1,723,264,270 ක දඩ මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| | මුදල<br>------<br>රු. | මුදල<br>------<br>රු. |
|---|---|---|
| අන්තර්ගත ප්‍රමාණය වෙනස්වීම සඳහා දඩ මුදල | | |
| වාර කොන්ත්‍රාත් | 1,138,147,270 | |
| අත්පිට ටෙන්ඩර් | 380,285,100 | |
| | ----------------- | 1,518,432,370 |
| සල්ෆර් හා අළු අන්තර්ගතය වෙනස්වීම සඳහා දඩ මුදල | | 204,831,900 |
| | | ----------------- |
| එකතුව | | 1,723,264,270 |
| | | =========== |

(ii) එම ප්‍රසම්පාදනයන්හිදී වර්තමාන සැපයුම්කරු සමඟ එකඟ වූ මිලට වැඩි ඉහළ මිලකට ලංකා නැව් සංස්ථාවෙන් (CSC) මෙට්‍රික් ටොන් 141,046 ක ගල් අඟුරු ප්‍රසම්පාදනය කිරීම හේතුවෙන්, ලංකා විදුලිබල මණ්ඩලයට රු. 68,141,580 ක අතිරේක වියදමක් දැරීමට සිදුවී තිබුණි. තවද, පිළිගත් ප්‍රසම්පාදන පරිපාටියක් අනුගමනය කිරීමෙන් තොරව හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් තොරව එම ප්‍රසම්පාදනයන් ක්‍රියාත්මක කර තිබුණි.

(iii) මීට අමතරව ඉහත ජේදයේ සඳහන් පරිදි ලංකා නැව් සංස්ථාව විසින් සපයන ලද ගල් අඟුරු වල බාල තත්ත්වය හේතුවෙන් රු. 852,768,000 ක පාඩුවක් මණ්ඩලය විසින් හඳුනාගෙන තිබුණි.

(iv) තාප ගල් අඟුරු ගබඩා කිරීමට පෙර විදුලිබල පිරියත අංගණයේ එළීම සඳහා අවශ්‍ය අමු (deaf) ගල් අඟුරු හා තාප ගල් අඟුරු අඩු සැපයීම පිළිවෙලින් මෙට්‍රික් ටොන් 7,635 ක් හා මෙට්‍රික් ටොන් 29,896 ක් වූ අතර ඒවායේ වටිනාකම පිළිවෙලින් රු. 55,390,920 ක් හා රු. 462,639,190 ක් විය. එම මුදල් පිළිවෙලින් 2009 හා 2012 වර්ෂයේ සිට මේ දක්වා නිරවුල් කර නොතිබුණි.

(v) ලංකා විදුලිබල මණ්ඩලය විසින් කරන ලද ගණනය කිරීම්වලට අනුව, 2014 සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ ගල් අඟුරු කාලීන ආකාරයෙන් නොසැපයීමේ ප්‍රතිඵලයක් ලෙස ලක්විජය විදුලිබල පිරියත අඩුවෙන් යෙදවීම හේතුවෙන් සිදු වී තිබූ පාඩුව රු. 983,230,000 ක් විය.

(vi) වරායේදී ගල් අඟුරු මෙහෙයුම් පිළිබඳ වූ ප්‍රමාද ගාස්තු රු. මිලියන 607 ක මුදලක් ලංකා කෝල් සමාගම හා ලංකා නැව් සංස්ථාව අතර බෙදා ගැනීමෙන් තොරව තනි වගකීම පදනම් කරගෙන ලංකා කෝල් සමාගමට ප්‍රතිපූර්ණය කර තිබුණි.

### 3.6 නිෂ්කාර්ය වත්කම්

--------------------

ගල් අඟුරු ප්‍රවාහනය සඳහා රු. 1,129,256,732 ක පිරිවැයකට 2009 වර්ෂයේදී මිලදී ගත් ටග් බෝට්ටු 02 ක් හා බත්තල් 03 ක් ගල් අඟුරු බෑමේ මෙහෙයුම් සඳහා සුදුසු නොවූ බැවින්, මේ දක්වා නිෂ්කාර්යව තිබුණි.

### 3.7 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ බඳවා ගැනීම් පරිපාටිය (SOR) දීර්ඝ කාලයක් තුළ යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) අනුමත ස්ථිර කාර්ය මණ්ඩලයේ 3856 ක් වූ තනතුරු 2015 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු වී තිබූ අතර එම තනතුරුවලින් වැඩි ප්‍රමාණයක් කොන්ත්‍රාත් හා අනු කොන්ත්‍රාත් පදනම මත පුරවා තිබුණි.

| වර්ගය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | කොන්ත්‍රාත් පදනම/ මැන් පවර් පදනම මත පුරවන ලද සංඛ්‍යාව |
|---|---|---|
| විධායක | 311 | 0 |
| මධ්‍යම මට්ටමේ තාක්ෂණික සේවය | 226 | 8 |
| ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි වර්ග | 510 | 1058 |
| කාර්යාල සේවක වර්ග | 63 | 287 |
| රියදුරු | 75 | 551 |
| පුහුණු තාක්ෂණික සේවය<br>අර්ධ පුහුණු තාක්ෂණික සේවය | 2628 | 3887 |
| වෙනත් පුහුණු ශ්‍රේණි | 43 | 6 |
| එකතුව | 3856 | 5797 |

(ඇ) පවත්නා බඳවා ගැනීම් පරිපාටියට අනුව, මානව සම්පත් නිලධාරී (HRC) මුළු කාර්ය මණ්ඩලයෙන් සියයට 50 ක් බාහිරව පුරවන අතර එම ප්‍රතිශතය වර්ෂයෙන් වර්ෂයට සියයට 85 ක් දක්වා වැඩි කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද ලංකා විදුලිබල මණ්ඩල ඉතිහාසයේ දීර්ඝම කාලයක් ඉංජිනේරුවරුන් දෙදෙනෙකු විසින් අංශ ප්‍රධානී කාර්යයන් ආවරණය කරන බැවින් මෙම බාහිරව බඳවා ගන්නා සේවකයන්ට උසස්වීම් යෝජනා ක්‍රමයේ පැහැදිලි උසස්වීම් මාර්ගයක් ඇති බව නිරීක්ෂණය නොවීය.

(ඈ) මානව සම්පත් අංශයේ ප්‍රධාන තනතුර, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) වන නමුත්, එම තනතුර වෙනත් සේවාවලට විශේෂයෙන් විදුලි ඉංජිනේරුවරුන් සඳහා විවෘත වීමට හැකිවන පරිදි බඳවා ගැනීම් පරිපාටියේ (SOR) එම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද විශේෂයෙන් සඳහන් කර නොතිබුණි.

(ඉ) මානව සම්පත් කළමනාකරු (HRM) හා මානව සම්පත් නිලධාරි (HRO) සෘජුවම බඳවා ගැනීම සඳහා 100 කට වැඩි ප්‍රමාණයක් සේවකයන් සිටින ආයතනයක මානව සම්පත් ක්ෂේත්‍රයේ අවශ්‍යවන වර්ෂ 06 ක පළපුරුද්ද ලංකා විදුලි මණ්ඩලයේ කටයුතු කළ යුතු මුළු සේවක සංඛ්‍යාව සමඟ සැසඳීමේදී ප්‍රමාණවත් නොවීය.

**4. පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | වත්කම් කළමනාකරණය | ලංකා විදුලි මණ්ඩලයේ බෙදාහැරීම් අංශයන්හි කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ නිම කිරීමේ දිගු ප්‍රමාදයන් නිරවුල් කර ගැනීම හා ලංකා විදුලි මණ්ඩලයට අයත් දිවයින පුරා විසිරුණු ඉඩම් මැනීම, තක්සේරු කිරීම හා ආරක්ෂා කිරීම වේගවත්ව සිදු කිරීම. |
| (ආ) | ණයගැති පාලනය | ණයගැතියන් හා වෙනත් ලැබිය යුතු මුදල් කාලීනව අයකර ගැනීම හා කාලීන ආකාරයෙන් තොග සැපයුම් පිළිබඳ ඇප තැන්පතු යාවත්කාලීන කිරීම. |
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය | ලංකා විදුලි මණ්ඩලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා හැකිවන පරිදි මානව සම්පත් කළමනාකරණය |